# දෙමාපියන්ගේ විදේශගතවීම ළමා අපයෝජනය කෙරෙහි සිදු කරන බලපෑම (කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්)

ඩී. එම්. සී. දිසානායක[1]

**සංක්ෂේපය**

ළමා අපහරණය වූ කලී ලාංකික ජන සමාජය විෂයෙහි උද්ගත වී ඇති සංකීර්ණ සමාජ ගැටලුවකි. 1977 ශ්‍රී ලාංකික ආර්ථිකයේ සිදුකළ ව්‍යුහාත්මක වෙනස්කම් සමග නව රැකියා හා ආදායම් ප්‍රවේශයක් ලෙස දෙමාපියන්ගේ විදේශගතවීම වර්තමානය වනවිට රටට විදේශ විනිමය ලබාදෙන ප්‍රබල ආර්ථික සාධකයක් බවට පත් වී ඇත. නමුත් දෙමාපියන් විදේශගත වූ පවුල් ආශ්‍රිතව ළමා අපයෝජන සිද්ධීන් ක්‍රමිකව වාර්තා වීමේ උපනතියත් සමග මෙම පර්යේෂණය කාලෝචිත මෙන්ම ප්‍රායෝගික වූවක් වේ. මේ අනුව දෙමාපියන්ගේ විදේශගතවීම ළමා අපයෝජනය ඇති වීමට සිදු කරන බලපෑම කෙබඳුද? යන්න පර්යේෂණයේ ගැටලුව වේ. මෙහි මුඛ්‍ය පරමාර්ථය දෙමාපියන්ගේ විදේශගතවීම හා ළමා අපයෝජනය අතර ඇති සම්බන්ධය කෙබඳුදැයි අවබෝධ කරගැනීමයි. ළමයින් කෙරෙහි ඇති කරන බලපෑම්වල ස්වරූපය හඳුනා ගැනීම, දෙමාපියන්ගේ විදේශගතවීම සඳහා බලපාන සමාජ ආර්ථික පසුබිම හඳුනා ගැනීම හා ළමයින් ඇතිකර ගන්නා සෘණාත්මක ප්‍රතිවිපාක අවම කරගැනීම සඳහා උචිත ක්‍රමෝපායන් හඳුන්වාදීම මෙම පර්යේෂණයේ අරමුණු විය. පර්යේෂණ ක්‍රමවේදය ලෙස සිද්ධි අධ්‍යයනය භාවිත කරන ලදී. මෙම ක්‍රමවේදය ඔස්සේ ළමා අපයෝජනය කෙරෙහි බලපාන සමාජ සාධක හඳුනාගෙන එම සාධක වෙත දෙමාපියන්ගේ විදේශගතවීම කොතරම් බලපෑමක් කර ඇති ද යන්න තහවුරු කරමින් පොදු සාමාන්‍යකරණයක් කර ඇත. ප්‍රාථමික හා ද්විතියික දත්ත ද්විත්යම යොදාගත් අතර ප්‍රශ්නාවලී හා අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා යන ශිල්ප ක්‍රමයන් මඟින් ප්‍රාථමික දත්ත රැස් කිරීම සිදුකර ඇත. නිස්සම්භාවී ක්‍රමයේ සාරත නියැදිය යටතේ කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මව හෝ පියා විදේශගත වූ පවුල් 50 ක නියැදියක් තෝරා ගන්නා ලදී. විස්තරාත්මක සංඛ්‍යායනය ද ඇතුළත්ව මධ්‍යස්ථය, සහසම්බන්ධතාවය හා කයිවර්ග පරීක්ෂාව වැනි ක්‍රම දත්ත විශ්ලේෂණය සඳහා යොදාගත් අතර ඒ සඳහා SPSS හා Excel මෘදුකාංග භාවිත විය. මේ අනුව මව හෝ පියාගේ විදේශගතවීම ළමා අපයෝජනය කෙරෙහි සෘජු හේතු සාධකයක් වී ඇති බව නිගමනය කරගත හැකි විය. එමෙන්ම පවුලේ සමාජිකයන් හා ඥාතීන්ගෙන් ළමා අපයෝජන සිදු වීමේ ඉහළ ප්‍රවණතාවයක් පැවතීම හා සිදුවන ළමා අපයෝජනවලින් බහුතරයක් නීතිය ඉදිරියේ වාර්තා නොවීම ආදිය ද අනාවරණය කරගත හැකි විය. මෙම ගැටලුවට පිළියම් ලෙස ළමයින්ගේ අපයෝජන සම්බන්ධයෙන් ක්‍රියාත්මකවන නෛතික රාමුව යාවත්කාලීන කරමින් විධිමත් ලෙස පවත්වාගෙන යා යුතුය. ළමා අපයෝජනයන් සම්බන්ධව ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳ අදාළ පාර්ශවයන් දැනුවත් කිරීම හා මේ සඳහා ජාතික ප්‍රතිපත්ති ක්‍රියාවට නංවමින් ක්‍රියාකල යුතුය. එනම් දෙමාපියන්ගේ විදේශගතවීම හා ළමා අපයෝජනය යන විචල්‍යයන් හි ප්‍රතිජානාත්මක සම්බන්ධතාවයක් පවතින බව පැහැදිලිය.

**මුඛ්‍ය පද :** *දෙමාපියන්ගේ විදේශගතවීම, ළමා අපයෝජනය, ළමයින්*

## 1.0 හැඳින්වීම

සමාජයීය මිනිසා සිය සමාජ තත්ත්වයන්හි ප්‍රතිජානාත්මක තත්ත්වයන් ප්‍රවර්ධනය කර ගැනීම සඳහා විවිධ සංක්‍රමණයන් සිදු කරයි. සංක්‍රමණ යනු මිනිස් චලනයක්වන අතර මානවයා හා පරිසරය අතර පවතින අන්තර් සම්බන්ධතාවය ද නිරූපණය කරන සංකීර්ණ සංකල්පයකි. එකී සංක්‍රමණ ක්‍රියාවලිය තුළ ශ්‍රම සංක්‍රමණ ප්‍රධාන වන අතර

[1] සමාජවිද්‍යා අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය dissanayake9483@gmail.com

විවිධාංගීකරණයේ ආරක්ෂිත හා විභවීයත්වයේ උපකරණයක් වශයෙන් සැලකිය හැකි මෙම ශ්‍රම සංක්‍රමණ ක්‍රියාවලිය වර්තමානය වන විට ලෝකයේ සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල් සංවර්ධන උපක්‍රමයන් වශයෙන් උපයුක්ත කර ගනු ලබයි. භූගෝලීය වශයෙන් එක් තැනක සිට තවත් තැනකට යාම සංක්‍රමණයක් ලෙස ඉතා සරලව අර්ථ දැක්විය හැකිය. නමුත් ශ්‍රම සංක්‍රමණය යනු මිනිස් ශ්‍රමය විතැන් වීමකි. එනම් "රැකියාවක් සඳහා ඕනෑම කෙනෙකු නිරන්තරයෙන් ඇතුළු වීම හා තමන්ගේ හේතුවකට වඩා රැකියාවක් කිරීමේ අරමුණකින් එක් රටක සිට තවත් රටකට සංක්‍රමණය වීම ජාත්‍යන්තර ශ්‍රම සංක්‍රමණය වේ"(අමරසේකර සහ දසනායක, 2004). මේ අනුව ශ්‍රම සංක්‍රමණ ක්‍රියාවලියට බලපාන ප්‍රධාන හේතු සාධකය ලෙස ආර්ථිකය දැක්වීම සාවද්‍ය නොවේ.

විදේශගත වීම වූ කලී ප්‍රතිජානාත්මක හා නිශේධනාත්මක යන ද්විත්වයෙන්ම මානව සමාජයට බලපෑම් කරන්නකි. මෙම විදේශ සංක්‍රමණයන්හි විධිමත් ආරම්භය වූයේ 1977 විවෘත ආර්ථිකයේ ව්‍යුහාත්මක වෙනස්කම් කේන්ද්‍ර කරගෙනය. මූලික අවස්ථාවේ දී කාන්තා ශ්‍රම සංක්‍රමණ ඉහළ අගයක් ගනු ලැබුව ද වර්තමානයේ දී එම තත්ත්වය වෙනස් වෙමින් පවතී. එනම් 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේ කාන්තාවන්ගේ සංක්‍රමණ 81,685 (38.63%) ක් ද පුරුෂයන්ගේ සංක්‍රමණ 129,774 (61.37%) ක් ද වශයෙන් දැක්වීම තුළින් ඒ බව පැහැදිලි වේ. (ශ්‍රී ලංකා විදේශ සේවා දෙපාර්තමේන්තුව, 2018). මේ කෙසේ වුවත් වර්තමාන ශ්‍රී ලංකාවේ විදේශගත වීමේ ප්‍රවණතාවය ක්‍රමිකව වර්ධනය වෙමින් පවතින අතර එහිදී කාන්තාවන්ගේ ගෘහ සේවය සඳහා විදේශගත වීම ද වර්ධනය වෙමින් පවතී. ශ්‍රී ලංකා විදේශසේවා නියුක්ති කාර්යාංශය දක්වන ආකාරයට එය 2014 ට සාපේක්ෂව 2018 දී 28.6% ක අඩු වීමක් පවතී. නමුත් 2017 ට වඩා 2018 දී සමස්ත රැකියා සඳහා විදේශගත වූ ශ්‍රමිකයන්ගේ ප්‍රමාණය 4.7% කින් යම් වර්ධනයක් දැකිය හැකි වේ. එමෙන්ම විදේශගතවීම් ඉහළ අගයක් ගනු ලබන කොළඹ හා ගම්පහ යන දිස්ත්‍රික්කවල විදේශගතවීම් ප්‍රවණතාවය 2017 ට සාපේක්ෂව 2018 දී යම් අඩුවීමක් දැකිය හැකි නමුත් කුරුණෑගල දිස්ත්‍රික්කයේ 2017 දී විදේශගත වීමේ ප්‍රමාණය 19,043ක් ද 2018 වර්ෂයේ දී 19,935 ක් ද වීම තුළින් එහි යම් වර්ධනයක් පෙන්නුම් කරන බව පැහැදිලි වේ (ශ්‍රී ලංකා විදේශසේවා දෙපාර්තමේන්තුව, 2018).

ළමයෙකු යනු සමාජ වර්ධනීය ක්‍රියාවලියේ ප්‍රධාන එක් විචල්‍යයක්වන අතර ළමයින්ගේ අයිතිවාසිකම් තහවුරු වන ආකාරයේ ජීවත් වීමට සුදුසු සමාජයක් සකස් කරදීම අත්‍යවශ්‍ය කරුණකි. නමුත් වර්තමාන සමාජ ව්‍යුහය ව්‍යාකුලත්වයට පත්කල හැකි ප්‍රබල සමාජ ප්‍රශ්නයක් ලෙස ළමා අපයෝජනය වර්ධනය වෙමින් පවතී. විවිධ නීත්‍යානුකූල තත්ත්වයන් යටතේ ළමයා කුමන ආකාරයට අර්ථ දැක්වූවද සාමාන්‍යයෙන් වයස අවුරුදු 18 ට අඩු ඕනෑම අයෙකු ළමයෙකුවන බව පොදු නීතිමය අර්ථ කථනය වේ. ඒ අනුව වැඩිහිටියෙකු හා වෙනත් ඕනෑම අයෙකු විසින් ළමයෙකුගේ පෞරුෂ වර්ධනය කෙරෙහි නිශේධනාත්මක ආකාරයෙන් ක්‍රියා කිරීම නැත්නම් අපහරණයක් ළමා අපයෝජනය ලෙස සරලව අර්ථ දැක්විය හැකි අතර ළමා අපයෝජනය ළමයින්ට නිසි අයුරින් නොසලකා හැරීමේ සිට ළමයා ලිංගිකව අපයෝජනයට ලක් කිරීම දක්වා සිදු වේ. "ළමයාගේ අයහපතට හේතුවිය හැකි යැයි යමක් කිරීම හෝ ළමයාගේ යහපතට හේතුවිය හැකි දෙයක් නොකර සිටීම ළමා අපයෝජනයයි"(පෙරේරා, 2004). එනම් ළමයෙකුගේ ශරීර වර්ධන ක්‍රියාවලියට අදාළ වූ තත්ත්වයන්ගේ සිට පෞරුෂ සංවර්ධනයට අදාළ වූ තත්ත්වයන් දක්වා ළමා අපයෝජනයන් සිදුවිය හැකිය. එමෙන්ම ළමයාගේ සෞඛ්‍යයට හා සංවර්ධනයට ඇත්ත වශයෙන්ම හානිකර හෝ හානිකරවීමට මග සලසන හා ළමයාව වේදනාවන්ට ලක් කරන ක්‍රියාවන් මෙන්ම ළමයාගේ යහපත වෙනුවෙන් යම් තැනැත්තෙකු විසින් කළ යුතුව තිබූ යම් දෙයක්

නොකර සිටීම මගින් ද ළමා අපයෝජනයක් සිදු විය හැකිබව මෙයින් පැහැදිලිවන අතර ළමයින්ට සිදුවන අපයෝජනයන් කායික, මානසික, ලිංගික හා නොසලකා හැරීම යන අකාරයට වර්ගීකරණය කර දැක්විය හැකිය.

ලංකාවේ වැඩිම අපයෝජන ප්‍රමාණයක් සිදු වී ඇති දිස්ත්‍රික්ක ත්‍රිත්වය වන්නේ කොළඹ, ගම්පහ සහ කුරුණෑගලයි. 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේ මෙම දිස්ත්‍රික්කවල අපයෝජන ප්‍රමාණය ඉහළ අගයක් ගන්නා අතර එය සංඛ්‍යාත්මකව දක්වන්නේ නම් 1330, 1066, 823 ක් ද ආදී වශයෙන් දැක්විය හැකිය (ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, 2019). මෙම දත්ත වාර්තාගත ළමා අපයෝජනයන් පමණක්වන අතර වාර්තා නොවන අපයෝජනයන් පවතින බව ද අවධානම්කාරී ළමයින් වර්ගීකරණයේ දී විදේශගත දෙමාපියන්ගේ ළමයින් ප්‍රධාන වන බවද ළමා ආරක්ෂක අධිකාරිය දක්වයි. එනම් මව, පියා හෝ දෙදෙනාම විදේශගත වීමෙන් ළමයින්ගේ රැකවරණය අඩාල වීම මත ළමා අපයෝජනය සඳහා ඉතා අවධානම්කාරී පරිසරයක් පවුල තුළ ගොඩනැගෙන බවයි.

මිනිසා වූ කලී සමාජීය සත්ත්වයෙකුවන අතර එහිදී මිනිසා විසින් ස්වකීය පුද්ගල පෞරුෂය සංවර්ධනය කර ගැනීම ස්වයං පරිවර්තක ක්‍රියාවලියක් නොවේ. යම් පුද්ගලයෙකු සමාජීය පුද්ගලයෙකු වශයෙන් සමාජයට අනුගත වීමේ දී පවුල තුළින් ලැබෙන ප්‍රාථමික සමාජානුයෝජනය අත්‍යවශ්‍ය වූවක් වේ. එනම් ජෝර්ජ් හර්බට් මීඩ් නම් මනෝ විද්‍යාඥයා දක්වන්නේ "දෙමාපියන් පිළිගත් ධර්මතාවන් දරුවන් විසින් අභ්‍යන්තරීකරණය කරගෙන හොඳ සුපහන් සිතක් තනා ගැනීමේ ක්‍රියාවලිය සමාජානුයෝජනය වන බවයි"(අමරසේකර, 1997). මෙම ප්‍රාථමික සමාජානුයෝජන ක්‍රියාවලිය තුළ මවගේ සහ පියාගේ භූමිකාවන් සුවිශේෂිවන අතර ළමයින් සිය අභ්‍යන්තරය සකස් කරගැනීම සිදු වන්නේ ඔවුන්ගේ ක්‍රියාකාරීත්වයන් ආශ්‍රයෙනි. ළමයෙකු විෂයෙහි දෙමාපියත්ව භූමිකාව එනම් දෙමාපිය දාරක සම්බන්ධතාව (Parent- child relation) කෙරෙහි අවධානය යොමු කිරිමේ දී ළමයින් දෙමාපියන් හා සෘජුවම සම්බන්ධවීමක් සිදු වේ(වන්නිආරච්චි, 2003). දරුවන්ගේ භාෂාත්මක කුසලතා වර්ධනය, දරුවන්ගේ සබුද්ධිකත්වය හෙවත් තර්කානුකූලභාවය නිර්මාණය කිරීම, චිත්තවේගික සංවර්ධනය, දාරක පෞරුෂත්ව සංවර්ධනය ආදී විවිධ අංශයන් යටතේ ළමයින් කෙරෙහි දෙමාපියන්ගේ බලපෑම අත්‍යවශ්‍ය වූවක් වේ. නමුත් යම් පවුලක මව හෝ පියා නැතිනම් දෙදෙනාම විදේශගත වූ විට එය ළමා සමාජානුයෝජනයට බලපෑම් කිරීමේ ස්වභාවයකින් යුක්ත වන අතර සෘජුවම ළමා අපයෝජනය කෙරෙහි බලපෑම් කාරකයක් වේ.

"මවගේ විදේශගත වීම හේතුවෙන් බිඳුණු පවුල් ක්‍රමයක් (Broken Family) නිර්මාණය වේ. එහිදී සිදු වන්නේ පවුලේ න්‍යෂ්ටිය මෙන්ම සක්‍රීය බලවේගය වශයෙන් හැඳින්විය හැකි මව දරුවන්ගෙන් ඈත් වීමකි"(ජයසිංහ සහ කුමාර, 1996). එනම් එය ළමයින්ගේ අපයෝජනය කෙරෙහි ප්‍රබල ලෙස බලපෑම් කරන්නක් වේ. මව විදේශගත වීමත් සමඟ බොහෝ පියවරුන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීම තුළ දරුවන්ගේ අධ්‍යාපනය අඩාල වීම, භාරකරයන්ගේ නොසලකා හැරීම ආදී විවිධ අපයෝජනයන්ට ලක් වීමක් සිදු වේ. එනම් දරුවන්ගේ ආරක්ෂාව කෙරෙහි මව කොතරම් වැදගත් ද යත් පවුල තුළ අනුකරණාත්මක අවධියේ දී දරුවන්ට විශේෂයෙන් මවගේ භූමිකාව වැදගත් වූවක් වේ. දෙමාපියන් විදේශගත නොවූ පවුල්වලට සාපේක්ෂව දෙමාපියන් විදේශගත වූ පවුල්වල වැඩිමහල් දරුවා විසින් මවගේ හෝ පියාගෙන් ඉටුවිය යුතු කාර්යයන් සිය සහෝදරයන් කෙරෙහි ඉටු කිරීම තුළ අධ්‍යාපනය කඩාකප්පල්කාරී වීම, අඩු වයසින් රැකියා සඳහා යාම වැනි ගැටලුවලට මුහුණ දෙයි. මෙය වර්තමානයේ දෙමාපියන් විදේශගත වූ පවුල් ආශ්‍රිතව හඳුනාගත හැකි සංකීර්ණ අපයෝජන තත්ත්වයකි. විශේෂයෙන්ම වර්තමානයේ විදේශගත පවුල් ආශ්‍රිතව දැකිය හැකි

ප්‍රධාන තත්ත්වයක් වන්නේ දරුවන් ආච්චි එසේත් නැත්නම් ඥාතීන් ළඟ රඳවා යාමකි. එහිදී දරුවන් නොසලකා හැරීම එනම් අවශ්‍ය මූලික හා ද්විතියික අවශ්‍යතා ප්‍රමාණවත් ආකාරයෙන් නොලැබීම ආදී විවිධ අපයෝජනයන්ට ලක්වීමක් සිදුවන අතර දෙමාපියන්ගේ විදේශගත වීමත් සමඟ විධිමත් භාරකාරීත්වය සම්බන්ධයෙන් ගැටලුකාරී තත්ත්වයන් ද ඇති වීමක් සිදු වේ.

වර්තමාන තාක්ෂණ විප්ලවයත් සමඟ ළමයින් සයිබර් අපයෝජනයට ලක්වීමක් සිදු වේ. එනම් අවුරුදු 10 ට අඩු ළමයින්ට එරෙහිව පැමිණිලි 15.9% කි. අවුරුදු 11-15 අතර ළමයින්ට සිදුවූ පැමිණිලි 36.5% කි. අවුරුදු 16 ට වැඩි ළමයින්ට සිදු වූ පැමිණිලි 47.6% කි. එමෙන්ම යොමු වූ සයිබර් පැමිණිලිවලින් 63.5% ක් සිදු වී ඇතිබව වාර්තා වූයේ ෆේස්බුක් මඟිනි (ළමා ආරක්ෂක අධිකාරිය, 2019). එනම් මෙහිදී විශේෂයෙන්ම දෙමාපියන් දරුවන් ආශ්‍රයෙන් ඈත්වීම තුළින් වර්තමානයේ අන්තර්ජාලය ළමයින් අපයෝජනයට ලක්වීමේ ප්‍රධාන මාධ්‍යක් වන බව පැහැදිලි වේ.

මව විදේශගත වූ පවුල්වල ළමයින් කායික දණ්ඩනයට නතු වීම, සිය නිවසේ රාජකාරී ළමයින් මත පැටවීම ඇතැම් විට පියාගේ ලිංගික අවශ්‍යතා ඉටුකර ගැනීමට ළමයින් භාවිත කිරීම හා නිසි පෝෂණය හා රැකවරණය නොලැබීම යන අපයෝජනයන්ට ගොදුරු වීමක් සිදු වේ. එපමණක් නොව දෙමාපියන් විදේශගත වූ පවුල්වල දික්කසාදය, මත්ද්‍රව්‍ය භාවිතය, දරිද්‍රතාවය හා බිඳුණු පවුල යන සාධක මත දෙමාපියන් විදේශගත නොවූ පවුල්වලට සාපේක්ෂව දෙමාපියන් විදේශගත වූ පවුල්වල ළමයින් විවිධ අපයෝජනයන්ට ලක් වීමේ ඉහළ ප්‍රවණතාවයක් පවතින බව වර්තමානය වන විට හඳුනාගත හැකිවන අතර සමාජ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් ඒ පිළිබඳ අධ්‍යයනය කිරීම කාලෝචිත ක්‍රියාවලියක් යැයි දැක්වීම නිරවද්‍ය වූවකි.

### 1.1 පර්යේෂණයේ පරමාර්ථය හා අරමුණු

පර්යේෂණ පරමාර්ථය වශයෙන් උපයුක්ත කරගනු ලැබුවේ දෙමාපියන්ගේ විදේශගත වීම හා ළමා අපයෝජනය අතර ඇති සම්බන්ධතාවයේ ස්වභාවය අවබෝධ කර ගැනීමයි. මෙහිදී පර්යේෂණ අරමුණු කීපයක් භාවිතයට ගත් අතර එය පහත ආකාරයට පෙන්වාදිය හැකිය.

- ළමා අපයෝජනයේ වර්තමාන තත්ත්වය හඳුනා ගැනීම
- දෙමාපියන් විදේශගත වීමට බලපෑ හේතු හඳුනා ගැනීම
- දෙමාපියන්ගේ විදේශගතවීමත් සමඟ ළමයින්ගේ භාරකාරීත්වය හා ඒ ආශ්‍රිත ගැටලු හඳුනා ගැනීම
- මව විදේශගත වූ පවුල්වල පියා හා දරුවන් අතර පවතින සම්බන්ධතාවය හඳුනා ගැනීම
- දෙමාපියන්ගේ විදේශගත වීම නිසා ළමයින්ට සිදුවන නිශේධනාත්මක බලපෑමේ ස්වභාවය හඳුනා ගැනීම

## 2.0 පර්යේෂණ සාහිත්‍ය විමර්ශනය

දෙමාපියන්ගේ විදේශ රැකියා නියුක්තිය පවුල් සංස්ථාවේ ක්‍රියාකාරීත්වය සහ පැවැත්ම කෙරෙහි ඇතිකර තිබෙන බලපෑම කුමක්ද? යන ගැටලුව යොදාගනිමින් දෙමාපියන්ගේ විදේශ රැකියා නියුක්තිය පවුල් සංස්ථාව කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ අධ්‍යයනය සිදුකර ඇත. මෙහිදී බහුතරයක් ගෘහ සේවය කේන්ද්‍ර කරගෙන සංක්‍රමණයන් සිදු වී ඇති

බවත් එම පවුල්වල සාමාජිකයන් විදේශ රැකියාව මගින් ඉහළ ආර්ථික මට්ටමකට ළඟා වී නොමැති වීම ආදී නිගමනයන්ට එළඹ ඇත (අමරතුංග, 2004).

ශ්‍රී ලංකාවේ මව්වරුන් විදේශගත වූ පවුල්වල ළමයින් වැඩි වශයෙන් විවිධ අපයෝජයන්ට යොමුවන අතර ඔවුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ද ගැටලු ඇති වේ.පියවරුන්ගේ වෙනත් විවාහ හේතුවෙන් ළමයින් මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහිද යොමු වේ (Perera and Rathnayaka, 2013).

ළමා අපයෝජනයේ ඓතිහාසික තත්ත්වය විශ්ලේෂණාත්මකව විග්‍රහ කරනු ලබන අතර ශ්‍රී ලංකාවේ අතීතයේ මෙන්ම වර්තමානයේ පිරිමි ළමයින් සංචාරකයන්ගේ අපයෝජනයට ලක්වීම හා කර්මාන්ත ක්ෂේත්‍රයේ ළමුන් කම්කරුවන් වශයෙන් යොදා ගැනීමක් සිදු වන බවයි (Silva, 2000).

**3.0 පර්යේෂණ ක්‍රමවේදය, විධික්‍රමය හා දත්ත රැස් කිරීමේ ශිල්ප ක්‍රමය**

මෙම පර්යේෂණය ප්‍රමාණාත්මක හා ගුණාත්මක යන ද්විත්වයම උපයෝගී කරගෙන සිදු කළ මිශ්‍ර පර්යේෂණයකි. එහිදී දෙමාපියන්ගේ විදේශගත වීම ළමා අපයෝජනය කෙරෙහි ඇති කරන ප්‍රතිජානාත්මක බලපෑමට වඩා නිශේධනාත්මක බලපෑම තීව්‍ර වේ යන උපන්‍යාසය ආනුභවිකව පරීක්ෂාකොට විදේශගත වූ පවුල්වල මතුපිට තොරතුරු ලබා ගැනීම සඳහා පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් ප්‍රත්‍යක්ෂමූලවාදී ක්‍රමවේදය ද දෙමාපියන් විදේශගත වූ පවුල්වල අපයෝජනයට ලක් වූ ළමයින් පිළිබඳ ගැඹුරින් දත්ත අධ්‍යයනය කිරීම සඳහා විෂයමූලවාදී ක්‍රමවේදය යොදාගනු ලැබීය. මෙහිදී උපන්‍යාසය තහවුරු කර ගැනීම සඳහා සමීක්ෂණ විධික්‍රමය ද දෙමාපියන්ගේ විදේශගතවීම ළමා අපයෝජනය කෙරෙහි ඇති කරන බලපෑම කෙබඳුද? යන්න යථාර්තවාදීව අනාවරණය කර ගැනීම සඳහා මානවවංශ ලේඛන විධික්‍රමය පර්යේෂණය සඳහා යොදා ගැනුණි. දත්ත රැස් කිරීමේ ශිල්ප ක්‍රමය වශයෙන් මූලික දත්ත ලබා ගැනීමේ දී ප්‍රශ්නාවලි ක්‍රමය යොදා ගත් අතර ගුණාත්මක දත්ත රැස්කිරීම සඳහා අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා හා සිද්ධි අධ්‍යයනය යොදා ගනු ලැබීය.

පර්යේෂණ ක්ෂේත්‍රය වශයෙන් තෝරා ගනු ලැබුවේ වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මල්කඩුවාව උතුර ග්‍රාම නිළධාරි වසමවන අතර නියැදිය වශයෙන් නිස්සම්භාවී නියැදි භාවිතයට අනුව සාරත නියැදිය යටතේ මල්කඩුවාව උතුර ග්‍රාම නිළධාරි වසමේ දෙමාපියන් විදේශගත වූ පවුල් 50 ක නියැදියක් තෝරාගත් අතර එහිදී දෙමාපියන් විදේශගත වූ පවුල්වල අපයෝජනයට ලක් වූ ළමයින්ගෙන් කායික හා ලිංගික අපයෝජනයට ලක් වූ ළමයින් පස්දෙනෙකු සිද්ධි අධ්‍යයනය සඳහා යොදාගනු ලැබීය.


**4.0 දත්ත විශ්ලේෂණය**

පර්යේෂණයේ දී රැස්කරගත් ප්‍රමාණාත්මක දත්ත විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම, කයි වර්ග පරීක්ෂාව ආදී විශ්ලේෂණ ක්‍රමවේදයන් ඔස්සේ විශ්ලේෂණය කල අතර ඒ සඳහා SPSS හා Excel මෘදුකාංග යොදාගනු ලැබීය. එමෙන්ම ගුණාත්මක දත්ත රැස් කිරීමේ දී යොදාගත් සිද්ධි අධ්‍යයනයන් විස්තරාත්මක ක්‍රමය යටතේ විශ්ලේෂණය කරනු ලැබීය.

### 4.1 දෙමාපියන්ගේ විදේශගත වීම හා සම්බන්ධ තොරතුරු

දෙමාපියන්ගේ විදේශගතවීම ළමා අපයෝජනයට සිදු කරන බලපෑම පිළිබඳ අධ්‍යයනයේ දී ප්‍රධාන වශයෙන් විදේශගත වී සිටින්නේ දරුවන්ගේ දෙමාපියන්ගෙන් කවුරුන් ද යන්න කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

ප්‍රස්තාරය 01: විදේශගත වූ පවුල් වල විදේශගත වූවන්ගේ ස්වභාවය





මූලාශ්‍රය : නියැදි සමීක්ෂණය, 2019

ඉහත ප්‍රස්ථාර සටහනට අනුව පියවරුන් විදේශගත වූ පවුල් 12 (24%) ක් ද මව්වරුන් විදේශගත වූ පවුල් 31 (62%) ක් ද දෙදෙනාම විදේශගත වූ පවල් 7 (14%) ක් ද හඳුනාගත හැකි විය. මේ අනුව ළමයින්ගේ පියවරුන්ට සාපේක්ෂව මව්වරුන්ගේ විදේශගත වීම ඉහළ අගයක් ගන්නා බව පැහැදිලි වේ.

### 4.2 දෙමාපියන් විදේශගතවීමට බලපෑ හේතු හඳුනා ගැනීම

මෙහිදී ආර්ථිකය සුවිශේෂවන අතර විදේශගත වීමට බලපෑ හේතු හඳුනා ගැනීමේ දී විදේශගත වීමට පෙර කුටුම්බ ආදායම පිළිබඳ සලකා බැලිය යුතුය. වැඩිම කුටුම්බ ආදායමක් සහිත 50000 ට වැඩි පවුල් (8%) ක් ද අඩුම ආදායම වශයෙන් 10000 ට අඩු පවුල් 16 (32%) ක් ද පවතී. කුටුම්බ 10 ක 10001-20000 අතර ආදායම් මට්ටමක් ද කුටුම්භ 09 ක 20001-30000 ක් අතර ආදායම් මට්ටමක් ද කුටුම්භ 7 ක 30001-40000 ක් අතර ආදායම් මට්ටමක් ද 40001-50000 ත් අතර ආදායමක් සහිත පවුල් 4 ක් ද හඳුනාගත හැකි විය.

ප්‍රස්තාරය 02: ළමයින්ගේ දෙමාපියන් විදේශගත වීමට බලපෑ හේතු




මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත, 2019

අධ්‍යයනය ක්ෂේත්‍රයෙන් ලබාගත් දත්තවලට අනුව ආදායම් මාර්ග වශයෙන් සුවිශේෂී වූ රැකියාවක් නොමැති අතර පෞද්ගලික අංශයේ රැකියා, කෘෂිකාර්මික නොවන ස්වයං රැකියාවන්ට බහුතරය යොමු වී ඇත. ඒ අනුව නියැදියෙන් 48% ක් ආර්ථික දුෂ්කරතාවයන් නිසා ද ස්වාමියාගේ මත්ද්‍රව්‍ය භාවිතය නිසා 22% ක් ද නියැදියෙන් 10 (20%) ක් වෘත්තිමය හේතු පදනම් කරගෙන ද විදේශගත වී ඇත. අවම ප්‍රමාණයක් විදේශගත වී ඇත්තේ මෙරට රැකියා අවස්ථා නොමැති වීම යන හේතු සාධකය නිසාවෙනි. එය නියැදියෙන් 10% කි. මේ පිළිබඳ තවදුරටත් කරුණු සොයාබැලීමේ දී බහුතරයක් පිරිස මෙරට රැකියාවක නිරත වුවද ලැබෙන මුදල පවුලේ අවශ්‍යතාවයන් සඳහා ප්‍රමාණවත් නොවීම මත විදේශගත වීමට බලපාන ප්‍රධාන හේතුව ආර්ථික දුෂ්කරතාවයවන බව හඳුනාගත හැකි වූ අතර මත්ද්‍රව්‍ය භාවිතය ද යම් ආකාරයක බලපෑමක් සිදු කරන බව පැහැදිලිය.

වගුව 01: පවුලේ මාසික ආදායම හා දෙමාපියන්ගේ විදේශගත වීමට බලපාන හේතු අතර ඇති සම්බන්ධතාවය


| විචල්‍ය | X2 | Df | p අගය |
|---|---|---|---|
| පවුලේ ආදාමය හා විදේශගත වීමට බලපාන හේතු අතර ඇති සම්බන්ධතාවය | 29.872 | 15 | 0.012 |

X2= 29.872, df= 15, p value = 0.012 (වෙසෙසි වේ)

මේ අනුව විදේශගත පවුල්වල මාසික ආදායාම හා දෙමාපියන්ගේ විදේශගතවීම අතර(p=0.012) ප්‍රමාණවත් සම්බන්ධතාවයක් දැකිය හැකි වේ.

### 4.3 දෙමාපියන් විදේශගත වීමෙන් පසු ළමයින්ගේ භාරකාරීත්වය දැරීම හා ඒ ආශ්‍රිතව ගැටලු හඳුනා ගැනීම

ප්‍රස්ථාරය 03 : ළමයින්ගේ භාරකාරීත්වය දැරීම




මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත, 2019

ප්‍රස්ථාර සටහන 3ට අනුව මව විසින් 18% ක් ද පියා විසින් 36% ක් ද නියැදියෙන් 30% ක් ආච්චි හෝ සීයා විසින් ද ඥාතීන් විසින් 14% ක් වශයෙන් ද භාරකාරීත්වය දරා ඇත. ඥාතීන් වශයෙන් නැන්දා, පුංචි යන හඳුනාගත හැකි වූ අතර ඥාතීන් නොවන හිතවත් අයට ද දරුවන්ගේ භාරකාරීත්වය ලබා දීම මෙහිදී විශේෂ වේ. එනම් මෙම දත්ත අනුව දරුවන්ගේ පියාට වැඩි භාරකාරීත්වයක් පවතින බව හඳුනාගත හැකිය. සමහර අවස්ථාවන් හි දී භාරකාරීත්වය දරන පුද්ගලයන් ළමයින්ගේ අවශ්‍යතා ප්‍රමාණවත් ආකාරයෙන් ලබාදීමට

නොහැකිවන තත්වයක් හඳුනාගත හැකිවිය. එමෙන්ම මෙම ප්‍රදේශයේ අධික මත්ද්‍රව්‍ය භාවිතයකින් හා දරුවන් ඒ සඳහා යොමු වන අතර ළමා ආරක්ෂක නිලධාරින්ගෙන් ලැබුණු තොරතුරු වලට අනුව ද බොහෝ දරුවන් මත්ද්‍රව්‍ය භාවිතය, හුවමාරුව ආදී කාර්යයන් සඳහා යොමු වී ඇත.

වගුව 02: දෙමාපියන්ගේ විදේශගත වීම නිසා ළමයින්ට සිදුවන බලපෑම්වල ස්වභාවය

| ළමයින්ට සිදුවන බලපෑම්වල ස්වභාවය | ප්‍රතිශතය |
|---|---|
| බැණ වැදීමකට ලක් වීම | 19.3% |
| පහරදීමකට ලක් වීම | 13.1% |
| ප්‍රතික්ෂේප කිරීමකට ලක් කිරීම | 9.3% |
| බිය වැද්දීමකට ලක් කිරීම | 15.1% |
| ලිංගික පින්තූර හෝ වීඩියෝ පෙන්වීම | 8.9% |
| අපහසුතාවයට පත්වන ආකාරයෙන් ලිංගික අවයව පෙන්වීම | 10.0% |
| ලිංගික අවයව ඇල්ලීමට බල කිරීම | 6.2% |
| හුදෙකලා කිරීමකට ලක් කිරීම | 6.9% |
| අවමන් කිරීමකට ලක් කිරීම | 6.9% |
| ලිංගික ක්‍රියාවකට යොමු කර ගැනීම | 4.2% |

මූලාශ්‍රය ා නියැදි සමීක්ෂණය, 2019

වගුව 02ට අනුව ළමයින් වැඩි පිරිසක් 19% ක් බැණ වැදීමකටත් 4% ක් ලිංගික ක්‍රියාවකට යොමු කරවා ගැනීමකට හා අපහසුතාවයට පත්වන ආකාරයෙන් ලිංගික අවයව පෙන්වීම 10% ක් ද 13% ක් පහරදීම්වලට ද 9% ක් ප්‍රතික්ෂේප කිරීම්වලට ද ලක් වී ඇත. නියැදියෙන් 15% ක් හා 9% ක් දක්වන්නේ බිය වැද්දීමකට හා ලිංගික පින්තූර හෝ වීඩියෝ පෙන්වීමේ තත්ත්වයන්ට මුහුණ දුන් බවයි. මේ අනුව දෙමාපියන්ගේ විදේශගත වීමත් සමඟ ළමයින් විවිධාකාරයේ අපයෝජනයන්ට ලක්වන බව පැහැදිලිය.
ළමයින්ගේ අන්තර්ජාලය හා සමාජ මාධ්‍ය භාවිතය පිළිබද අවධානය යොමු කිරීමේ දී බහුතරයක් fb භාවිත කරන අතර ඔවුන් සමඟ කරුණු සාකච්ඡා කිරීමේ දී විදේශගත දෙමාපියන් සමඟ සම්බන්ධතා පැවැත්වීමට සමාජ මාධ්‍ය භාවිත කරන බව හඳුනාගත හැකි විය. විශේෂයෙන්ම මුහුණුපොත හරහා නොදන්නා පුද්ගලයන් සමඟ සම්බන්ධවෙමින් අසභ්‍ය ඡායාරූප හා වීඩියෝ හුවමාරු, දුරකතන සංවාද හරහා අසභ්‍ය වචන භාවිතය වැනි සයිබර් අපයෝජනයන්ට යොමු වීමක් ද හඳුනාගත හැකිවිය.

**05. නිගමනය**

දරුවන්ගේ භාරකාරීත්වය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී දෙමාපියන් විදේශගත සමහර පවුල්වල ඥාතින් හා ඥාතීන් නොවන වශයෙන් භාරකාරීත්වයන් දැරීමක් සිදු වේ. මෙහිදී දෙමාපියන්ගේ විදේශගත වීමත් සමඟ ළමයින්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ගැටලුකාරීත්වයන් ඇතිවන අතර ළමයින්ගේ අවිධිමත් භාරකාරීත්වය ළමයාගේ අවශ්‍යතාවයන් ප්‍රමාණවත් ආකාරයෙන් ලබා නොදීමේ සිට ලිංගික බලපෑම් දක්වා හේතු වී ඇත. ඒ අනුව අපයෝජිත ළමයින්ගේ සංසිද්ධි ගෙනහැර බැලීමේ දී දෙමාපියන්

විදේශගත වූ පවුල්වල ළමයින් බහුතරයකගේ අධ්‍යාපන කටයුතු අඩාල වීම හා නිසි ආකාරයෙන් සිදු නොවීම, ළමයා සම්බන්ධතා පවත්වන පුද්ගලයන් පිළිබඳ සැලකිය යුතු අවධානයක් නොවීම අධික වශයෙන් ළමයින්ගෙන් වැඩ ගැනීම, පෝෂණය නොසලකා හැරීම ආදී තත්ත්වයන් හඳුනාගත හැකිවිය.

දෙමාපියන් විදේශගත වීමට බලපාන හේතු මොනවාද යන්න හඳුනා ගැනිමේ දී ආර්ථික දුෂ්කරතාවය මෙන්ම ස්වාමි පුරුෂයාගේ මත්ද්‍රව්‍ය භාවිතය බලපාන මූලික හේතුන් ලෙස දැක්විය හැකිය. එමෙන්ම පියාගේ විදේශගත වීමට සාපේක්ෂව වර්තමානය වන විට මව විදේශගත වූ ළමයින් මුහුණ දෙනු ලබන ප්‍රධාන ගැටලුව වන්නේ පියවරුන් මත්ද්‍රව්‍ය භාවිතය නිසා පවුල තුළ ඇතිවන නිශේධනාත්මක තත්ත්වයන්ය. එනම් මත්ද්‍රව්‍ය භාවිතය නිසා දවස් ගණනක් ගෙදර නොපැමිණීම, නොහඳුනන පුද්ගලයන් නිවසට කැඳවාගෙන ඒම මෙන්ම දරුවන්ගේ අවශ්‍යතායවන් සඳහා අවශ්‍ය මූල්‍යමය සම්පත් ලබා නොදීමක් සිදු වේ. මෙහිදී විශේෂයෙන්ම පිරිමි දරුවන් කල්ලි ගැසීම, මත්ද්‍රව්‍ය භාවිතයට ද යොමු වීමක් දැකිය හැකි විය. මේ අනුව පියා විදේශගත වූ පවුල් වලට සාපේක්ෂව මව විදේශගත වූ පවුල්වල ළමයින් අපයෝජනයට ලක් වීමේ ඉහළ ප්‍රවණතාවයක් වර්තමානය වන විට පවතී. දෙමාපියන් විදේශගත වීම නිසා ළමයින්ට සිදුවන බලපෑමේ ස්වරූපය හඳුනා ගැනීමේ දී දෙමාපියන්ගේ විදේශගත වීමත් සමඟ ළමයින් හුදෙකලා වූවන් බවට පත් වේ. මෙහිදී දෙමාපියන් විදේශගත නොවූ පවුලවලට සාපේක්ෂව දෙමාපියන් විදේශගත වූ පවුල්වල ළමයින්ගේ අන්තර්ජාල භාවිතය හා සිදුවන බලපෑම්කාරී තත්ත්වයන් කෙරෙහි අවධානය යොමු නොකරන තත්ත්වයක් තුළ ළමයින්ට සිදුවන සයිබර් අපයෝජනයන්ගේ වර්ධනයක් පවතී. එනම් පවුලේ මව පියා හෝ දෙදෙනාම විදේශගත වීම වැනි තත්ත්වයන් හේතු කරගනිමින් වර්තමානය වන විට වැඩි වශයෙන් ළමයින්ට නොසලකා හැරීමේ සිට ලිංගික වශයෙන් බලපෑම් කිරීම දක්වා සිදුවන අපයෝජනයන් හි ක්‍රමික ප්‍රවණතාවයක් පවතින අතර සමස්තයක් වශයෙන් ළමා අපයෝජන සමාජය තුළින් වාර්තා නොවී ගිලිහී යාම නිසා ළමා අපයෝජනයන් හි ප්‍රගතිශීලී වර්ධනයක් හා එය සමාජ ප්‍රගමනය පසුගාමී කරනු ලබන සංකීර්ණ සමාජ ප්‍රශ්නයක් බව නිගමනය කල හැකි විය.

## 6.0 යෝජනා

- දෙමාපියන්ගේ විදේශගත වීමෙන් පසු දරුවන් විධිමත් භාරකාරීත්වයකට යොමු කළ යුතු විධිවිධාන පිළිබඳ ජාතික නීතියක් සකස් කළ යුතුය.
- ළමා අපයෝජන සම්බන්ධයෙන් ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳ සියලු දෙනා දැනුවත් කිරීමේ වැඩසටහන් විධිමත් අධීක්ෂණය යටතේ ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාකළ යුතුය
- පොලීසිය, පරිවාස දෙපාර්තමේන්තුව හා ළමා ආරක්ෂක අධිකාරිය වැනි රාජ්‍ය අංශයන්ගේ ආයතනික ව්‍යුහය විධිමත් අධීක්ෂණයන් යටතේ පවත්වාගෙන යාමට අවශ්‍ය රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවිය යුතුය
- ළමා අපයෝජන සම්බන්ධ තොරතුරු ළමයින්ගේ අධ්‍යාපන විෂය නිර්දේශයන්ට එක් කිරීම හා පාසල් මට්ටමෙන් ළමයින්ට සිදුවන අපයෝජනයන්ගෙන් වැළකීමේ ක්‍රමවේදයන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය.
- වාර්තා නොවන ළමා අපයෝජනයන් නීතිය ඉදිරියට ගෙන ඒම සඳහා සුවිශේෂී වූ ක්‍රමවේදයන් ගොඩනැගිය යුතුය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

අමරසේකර, ඩී. (1997). *සමාජ විද්‍යා විමර්ශන.* දිවුලපිටිය: සරස්වතී ප්‍රකාශන.

අමරසේකර, ඩී. සහ දසනයාක, ආර්. (2004). *ඉඳුවර පර්යේෂණාත්මක ලේඛන සංග්‍රහය.* වරකාපොළ: ආරිය ප්‍රකාශකයෝ.

ජයසිංහ, ඒ. කේ. ජී. සහ කුමාර එන්. වී. ජී. ඒ. එච්. (1996). *සමාජ විද්‍යාව විවරණාත්මක ලිපි.* කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

පෙරේරා, එස්. (2004). *සමාජ ප්‍රශ්න.* කතෘ ප්‍රකාශන.

වන්නිආරච්චි, ජේ. එස්. (2003). *මව්පිය දරු වගකීම් සහ ළමා අයිතිවාසිකම්.* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ළමා ආරක්ෂාව පිළිබඳ අත්පොත, (2019). ජනාධිපති කාර්යාලය හා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, ISBN-978-955-1417-17-8.

Silva, H. D. (2000). *Some reflection on child abuse in Sri Lanka*. Sri Lanka journal of Child Health.

Perera, N. and Rathnayaka, R.R. (2013). *Sri Lankan's missing mothers,* A working paper on the effects of mother migration on children. colombo: save the children sri lanka publication.

ශ්‍රී ලංකා විදේශසේවා නියුක්ති කාර්යාංශය. (2018). *වාර්ෂික වාර්තාව* - 2018.

ළමා ආරක්ෂක අධිකාරිය. (2018). වාර්ෂික වාර්තාව - 2018

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය. (2019). Retrieved from www.childprotection.gov.lk